# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 83/7 — 1980 අප්‍රේල් 10 වැනි බ්‍රහස්පතින්ද — 1980.04.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී—බී 21/78.

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 140 වන වගන්තිය යටතේ සාදනු ලැබූ නියමාවලිය.

ඩබ්ලිව්. එම්. ඒ. විජේරත්න බණ්ඩා,
ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1980 මාර්තු මස 28 වන දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 1980 අප්‍රේල් මස 10 වන දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

2. පනතේ 18 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද, 1979 මැයි මස 28 වන දින අංක 38/2 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ, 1979 අංක 2 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය, එකී නියමාවලිය යටතේ මීට ඉහත දී කරන ලද කිසිදු ක්‍රියාවකට හානියක් නොවන පරිදි මෙයින් ඉවත් කරනු ලැබේ.

3. මෙම නියමාවලිය ක්‍රියාත්මක වූ විට (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් මෙම නියමාවලියෙහි විධිවිධාන යටතේ පිහිටුවනු ලැබිය යුතු ය.

4. (මෙහි මින්මතු "විශ්ව විද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයට මෙම ආයතනය අනුයුක්ත කරනු ලැබිය යුතු ය.

5. පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානයන්ට හා කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍යවලට යටත්ව, ආයතනයට පහත සඳහන් කටයුතු කිරීමට බලය ඇත්තේ ය—

(අ) ශිෂ්‍යයන් ඇතුල් කර ගැනීම;

(ආ) ආයතනයේ සහ විශ්ව විද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කොට ඇත්තේ වෛද්‍ය විද්‍යාවේ යම් විශේෂ ක්ෂේත්‍රයන් ද, ඒ විශේෂ ක්ෂේත්‍ර පිළිබඳ පශ්චාත් උපාධි තත්ත්වයේ ඉගැන්වීම, පුහුණුවීම සහ පර්යේෂණ කිරීම සඳහා කටයුතු සැලැස්වීම ;

(ඇ) විශ්ව විද්‍යාලයේ අනුමතයත්, කොමිෂන් සභාවේ එකඟත්වයත් ඇතිව, වෛද්‍ය විද්‍යාවේ විවිධ විශේෂ ක්ෂේත්‍රයන්හි ප්‍රදානය කළයුතු පශ්චාත් උපාධි, අභිඥන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා නිශ්චය කිරීම;

(ඈ) වෛද්‍ය විද්‍යාවේ විවිධ විශේෂ ක්ෂේත්‍රවල ප්‍රවීනත්වය ලැබූ තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්යය සඳහා විශ්ව විද්‍යාලයේ අනුමතය ඇතිව පශ්චාත් උපාධි විභාග පැවැත්වීම සහ එම විභාග මඟින් සාමර්ථ්‍යය ලබා විශ්ව විද්‍යාලය විසින් ආයතනය විමසීමෙන් පසු සාදනු ලැබිය හැකි අතුරු ව්‍යවස්ථා මගින් නියම කරන ලද වෙනත් කොන්දේසි සපුරාලීමෙන් පශ්චාත් උපාධි, අභිඥන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබූ තැනැත්තන් විශ්ව විද්‍යාලයට නිර්දේශ කිරීම;

(ඉ) ආයතනයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ පිටරට වෙනත් විශ්ව විද්‍යාල හෝ ආයතන සමඟ ආචාර්යවරයන්, ශිෂ්‍යයන් හා ශාස්ත්‍රධරයන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ඊ) අතුරු ව්‍යවස්ථාවකින් නියම කරනු ලැබිය හැකි පරිදි, ආයතනයට ඇතුල්වීමට අපේක්ෂා කරන තැනැත්තන් හෝ ආයතනයේ ශිෂ්‍යයන් විශ්ව විද්‍යාලවල දී හෝ විශ්ව විද්‍යාල මට්ටමේ අධ්‍යාපන ආයතනවල දී සාමර්ථ්‍යය ලත් විභාග හා ගත කළ අධ්‍යයන කාල සීමාව, ආයතනයේ

එවැනි විභාගවලට හා එවැනි අධ්‍යයන කාල සීමාවලට හෝ ඉන් යම් කොටසකට සමාන ලෙස පිළිගැනීම හා කිනැම අවස්ථාවක ඒ පිළිගැනීම ඉවත් කර ගැනීම;

(උ) ආයතනයේ කාර්ය සඳහා පුස්තකාල, රසායනාගාර හා වෙනත් ගොඩනැගිලි, ඉගැන්වීමේ, පුහුණු කිරීමේ සහ පර්යේෂණ කටයුතු සඳහා ඉදි කිරීම, ඒවාට උපකරණ සැපයීම හා ඒවා පවත්වාගෙන යෑම;

(ඌ) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ඇති කිරීම හා ප්‍රදානය කිරීම;

(එ) පර්යේෂණ හා පාඨමාලා හෝ පාඨමාලාවල කොටස් විශ්ව විද්‍යාලයෙන් හා ආයතනයෙන් බාහිර වූ ස්ථානවල පැවැත්වීමට කටයුතු, ඒ සඳහා විධිවිධාන සලස්වන අතුරු ව්‍යවස්ථා අනුව පිළියෙල කිරීම;

(ඒ) ආයතනය විසින් අනුමත කරන ලද තැනැත්තන් ආයතනයේ ආචාර්යවරයන් සහ පරීක්ෂකවරයන් ලෙස විශ්ව විද්‍යාලයේ එකඟත්වය ඇතිව පිළිගැනීම;

(ඔ) ගාස්තු ඉල්ලීම සහ භාර ගැනීම සඳහා විධිවිධාන සලස්වන යම් රීතියක් අනුව ගාස්තු ඉල්ලීම හා භාර ගැනීම; සහ

(ඕ) ආයතනයේ පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස අවශ්‍ය විය හැකි ඉහත සඳහන් බලතලවලට ආනුෂංගික වූ හෝ නොවූ වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම;

6. පහත සඳහන් තැනැත්තෝ ආයතනයේ නිලධරයෝ වන්නාහ :—

(අ) අධ්‍යක්ෂවරයා ; සහ

(ආ) වෙනත් යම් තනතුරක් දරන තැනැත්තකු මේ ඡේදයෙහි කාර්යය සඳහා නිලධරයකු බව නියමාවලි මගින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ ද, එකී තනතුරක් දරන තැනැත්තා.

7. (1) මෙම නියමාවලිය ක්‍රියාත්මක වූ විට, 1979 අංක 2 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 7 වන ඡේදයේ (1) වන අනුච්ඡේදය යටතේ පත් කරනු ලැබූ ප්‍රථම අධ්‍යක්ෂවරයා, ඒ නියමාවලිය ඉවත් කරනු ලැබීම නොතකා එම ආයතනයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා වශයෙන් තවදුරටත් ධුරය දැරිය යුතුය. ඔහු කලින් ධුරය අත්හැර යියහොත් මිස හෝ (4) වන අනුඡේදය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලයෙන් ඉතිරිව ඇති කාලය තුළ එම ධුරය දරන්නේ ය.

(2) පසුව පත්වන සෑම අධ්‍යක්ෂවරයෙකුම, ආයතනයේ කළමනාකාර මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන තැනැත්තන් තිදෙනෙකුගෙන් යුත් මුල මණ්ඩලයකින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ එසේ පත් කරනු ලැබූ සාමාජිකයා, අධ්‍යක්ෂ තනතුර භාර ගැනීම සඳහා ඒ ආයතනය විසින් මුදා හැරිය යුතු ය.

(3) එක් එක් අධ්‍යක්ෂවරයෙක්, කලින් ධුරය අත්හැර ගියහොත් මිස හෝ (4) වන අනුච්ඡේදය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලයක් ගතවීම හෝ ඔහුට හැටපස් වන විය සම්පූර්ණ වීම යන මේ අවස්ථාවලින් ප්‍රථමයෙන් එළඹෙන අවස්ථාව තෙක් ධුරය දරන්නේ ය.

(4) දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා කැඳවනු ලැබූ කළමනාකාර මණ්ඩලයේ විශේෂ රැස්වීමක දී ඒ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්ද සංඛ්‍යාවකින් සම්මත කර ගනු ලැබූ දෝෂාරෝපණ යෝජනාවක් මත කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් අධ්‍යක්ෂවරයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතුය. එවැනි විශේෂ රැස්වීමක මුලසුන දැරීම සඳහා, එම විශේෂ රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරින් අධ්‍යක්ෂ නොවන යම් සාමාජිකයකු තෝරා පත් කරගත යුතු ය.

(5) ධුරයෙන් ඉල්ලා අස්වන හෝ ඉවත් කරනු ලබන අධ්‍යක්ෂවරයෙක්, අධ්‍යක්ෂවරයකු වශයෙන් තමා පත් කරනු ලැබීමට ඉහතින්ම, උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටියේ නම් සහ ඔහු හැටපස් වන විය සම්පූර්ණ කොට නොමැති නම්, ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ඔහුගේ ස්ථිර තනතුරට ඔහුට පෙරළා පැමිණිය හැකි ය.

(6) නිවාඩු පිට සිටීම, රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙන යම් හේතුවක් නිසා තම ධුරයේ කාර්ය ඉටු කිරීමට අධ්‍යක්ෂවරයාට තාවකාලිකව නොහැකි වුවහොත්, එසේ කාර්ය ඉටු කිරීමට නොහැකිවීමෙන් දින හතක් ඇතුළත ඒ ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යයි කොමිෂන් සභාව අදහස් කරන වැඩ පිළිවෙලක් කොමිෂන් සභාව විසින් යෙදිය යුතු ය. එසේ වැඩ පිළිවෙළක් යොදන තෙක් විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා විසින් ඒ ධුරයේ එදිනෙදා කාර්ය කර ගෙන යා යුතු ය.

(7) අධ්‍යක්ෂ ධුරයෙහි යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, ඒ පුරප්පාඩුව ඇති වී දින හතක් ඇතුළත (2) වන අනුඡේදය යටතේ ස්ථිර පත්වීමක් කරනු ලබන තුරු ඒ ධුරයේ කටයුතු කර ගෙන යාමට සුදුසු යයි කොමිෂන් සභාව අදහස් කරන වැඩ පිළිවෙළක් කොමිෂන් සභාව විසින් යෙදිය යුතු ය. එසේ වැඩ පිළිවෙළක් යොදන තෙක් විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා විසින් ඒ ධුරයේ එදිනෙදා කාර්යය කර ගෙන යා යුතු ය.

8. (1) අධ්‍යක්ෂවරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා හා ශාස්ත්‍රීය නිලධරයා වන්නේ ය. ඔහු කළමනාකාර මණ්ඩලයේ නිල බලයෙන් පත් වූ සාමාජිකයකු වන අතර, එක් එක් අධ්‍යයන සභාවක නිල බලයෙන් පත් වූ සාමාජිකයකු ද වන්නේ ය. ආයතනයේ වෙනයම් බල මණ්ඩලයක හෝ මණ්ඩලයක රැස්වීමක් කැඳවීමට, රැස්වීමකට පැමිණ සිටීමට හා එහි දී කථා කිරීමට ඔහුට හිමිකම් ඇති නමුදු, ඔහු ඒ බල මණ්ඩලයේ හෝ මණ්ඩලයේ සාමාජිකයෙක් වන්නේ නම් මිස, එකී යම් රැස්වීමක දී ඡන්දය දීමට ඔහුට හිමිකම් නොමැත්තේ ය.

(2) කළමනාකාර මණ්ඩලය විසින් ඒ සම්බන්ධයෙන් කලින් කල තමා වෙත නීත්‍යානුකූලව නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව, ආයතනයට අදාල වන පරිදි පනතේ හා යම් උචිත සාධන පත්‍රයක යෙදූ ඇති විධිවිධාන යථා පරිදි පිළිපැදීම ගැන වග බලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය. ඒ කාර්යය සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන සියළු බලතල ඔහුට ඇති අතර, ඔහු විසින් ඒ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) කළමනාකාර මණ්ඩලයේ හා එක් එක් අධ්‍යයන සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කෙරෙන බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය.

(4) අධ්‍යක්ෂවරයා ආයතනයේ ගණන්දීමේ නිලධරයා වන්නේ ය.

(5) ආයතනය තුළ විනය පවත්වා ගැනීම පිළිබඳව අධ්‍යක්ෂවරයා වගකිව යුතු ය.

9. පහත දැක්වෙන බල මණ්ඩල, ආයතනයේ බල මණ්ඩල වන්නේ ය:—

(අ) කළමනාකාර මණ්ඩලය ;

(ආ) අධ්‍යයන සභාව හෝ සභා ; සහ

(ඇ) නියමාවලි මගින් බල මණ්ඩල වශයෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් මණ්ඩල.

10. (මෙහි මින් මතු " මණ්ඩලය " යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකාර මණ්ඩලය ආයතනයේ අධ්‍යයන හා විධායක මණ්ඩලය වන අතර, එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය.

(1) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකවරයන්, එනම්—

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිතයා ;

(ඇ) සෞඛ්‍යය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිතයා ;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිතයා ;

(ඉ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා ;

(ඊ) මහජන සෞඛ්‍ය සේවා විෂයය භාර සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;

(උ) වෛද්‍ය සේවා විෂයය භාර සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;

(ඌ) රසායනාගාර සේවා විෂයය භාර සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා

(එ) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨාධිපති ;

(ඒ) ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපති.

(2) පහත සඳහන් අනෙක් සාමාජිකවරයන්, එනම්—

(අ) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය විසින් එම පීඨයට අයත් ප්‍රජා වෛද්‍ය විද්‍යා, වෛද්‍ය විද්‍යා, ශල්‍ය විද්‍යා, ධාත්‍රී භෘත්‍යය හා නාරීවේද, කෞමාරභෘත්‍යය සහ මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශ ප්‍රධානීන් අතුරින් (පීඨාධිපති හැර) තෝරා පත් කර ගන්නා ලද සාමාජිකයන් දෙදෙනෙක් ;

(ආ) ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය විසින් එම පීඨයට අයත් ප්‍රජා වෛද්‍ය විද්‍යා, වෛද්‍ය විද්‍යා, ශල්‍ය විද්‍යා, ධාත්‍රී භෘත්‍යය හා නාරීවේද, කෞමාරභෘත්‍යය සහ මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශ ප්‍රධානීන් අතුරින් (පීඨාධිපති හැර) තෝරා පත් කර ගන්නා ලද සාමාජිකයන් දෙදෙනෙක් ;

(ඇ) ශ්‍රී ලංකාවේ යාපනය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය විසින්, එම පීඨයට අයත් ප්‍රජා වෛද්‍ය විද්‍යා, වෛද්‍ය විද්‍යා, ශල්‍ය විද්‍යා, ධාත්‍රී භෘත්‍යය හා නාරීවේද, කෞමාරභෘත්‍යය සහ මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශ ප්‍රධානීන් අතුරින් තෝරා පත් කර ගන්නා ලද එක් සාමාජිකයෙක් ;

(ඈ) රුහුණු විශ්ව විද්‍යාලීය විද්‍යායතනයේ වෛද්‍ය පීඨය විසින් එම පීඨයට අයත් ප්‍රජා වෛද්‍ය විද්‍යා, වෛද්‍ය විද්‍යා, ශල්‍ය විද්‍යා, ධාත්‍රී භෘත්‍යය හා නාරීවේද, කෞමාරභෘත්‍යය සහ මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශ ප්‍රධානීන් අතුරින් තෝරා පත් කර ගන්නා ලද එක් සාමාජිකයෙක් ; සහ

(ඉ) අධ්‍යාපන, වෘත්තීය, විද්‍යාත්මක හෝ පරිපාලන ක්ෂේත්‍රයන්හි විශිෂ්ඨ සේවාවන් ඉටු කර ඇති තැනැත්තන් අතුරින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් අට දෙනෙක්.

එසේ වුව ද, එසේ පත් කරනු ලැබූ සාමාජිකයන් අතුරින් යටත් පිරිසෙයින් සාමාජිකයන් පස් දෙනෙකු වෛද්‍ය වෘත්තියට අයත් සාමාජිකයන් විය යුතු ය.

11. (1) මණ්ඩලයේ සාමාජිකයන් විසින්, ඔවුන් අතුරින් එක් අයකු මණ්ඩලයේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත යුතු අතර, ඔහු මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමක මුලසුන දැරීමට සභාපතිවරයාට නොහැකි වුවහොත්, සාමාජිකයන් විසින්, පැමිණ සිටින යම් සාමාජිකයකු ඒ රැස්වීමෙහි මුලසුන දැරීමට තෝරා පත් කර ගත යුතු ය.

(2) සභාපතිවරයා, පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන එක් වර්ෂයක කාලයක් තුළ එම ධුරය දැරිය යුතු අතර, ඔහු නැවත තෝරා පත් කර ගනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(3) පත් කරනු ලැබූ හෝ තෝරා පත්කර ගනු ලැබූ යම් සාමාජිකයෙක්, ඔහු කලින් ධුරය අත්හැර ගියහොත් මිස, අවස්ථාවෝචිත පරිදි ඔහු පත් කරනු ලැබූ දින සිට හෝ තෝරා පත් කර ගනු ලැබූ දින සිට තුන් වර්ෂයක කාලයක් ධුරය දරන අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට හෝ තෝරා පත් කර ගනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය.

එසේ වුව ද, තෝරා පත් කර ගනු ලැබූ හෝ පත් කරනු ලැබූ යම් සාමාජිකයකු, තම ධුර කාලය ඉකුත්වීමට පෙර තම ධුරය අත්හැර ගියහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා, ඔහු කලින් ධුරය අත්හැර ගියහොත් මිස, තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දරන්නේ ය.

එසේම තවදුරටත්, තෝරා පත් කර ගන්නා ලද එක් එක් සාමාජිකයා, මණ්ඩලයේ සාමාජිකයෙක් වීමට සුදුස්සෙක් වුයේ යම් තත්ත්වයක් නැතහොත් සාමාජිකත්වයක් අනුව ද, ඒ තත්ත්වය හෝ සාමාජිකත්වය දරන තාක් පමණක් ඔහු තම ධුරය දරන්නේ ය.

(4) අධ්‍යක්ෂවරයා වෙත යවනු ලබන, තම අත්සන යටතේ වූ ලිපියක් මගින් මණ්ඩලයට තෝරා පත් කරගනු ලැබූ සාමාජිකයකුට තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත යවනු ලබන, තම අත්සන යටතේ වූ ලිපියක් මගින් මණ්ඩලයට පත් කරනු ලැබූ සාමාජිකයකුට තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) පැමිණ නොසිටීමට නිවාඩු ලබා නොගෙන මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණියහොත්, පත් කරනු ලැබූ සාමාජිකයකු, මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් වූ තම ධුරය අත්හැර ගිය ලෙස සැලකිය යුතු අතර, ඒ හේතුවෙන් ඇතිවන පුරප්පාඩුව පිරවීමට කොමිෂන් සභාව විසින් සුදුසු තැනැත්තකු පත් කළ යුතු ය.

(7) මණ්ඩලයේ සාමාජිකයකුට යම් පාරිශ්‍රමිකයකට හිමිකම් නොමැති නමුත්, නිල බලයෙන් පත්වන සාමාජිකයකු නොවන සාමාජිකයකුට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන දීමනා ගෙවනු ලැබිය හැකි ය.

(8) මණ්ඩලයේ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය, එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(9) එක් එක් වර්ෂයකදී අටකට නො අඩු රැස්වීම් සංඛ්‍යාවක් පැවැත්වෙන පරිදි, අවශ්‍ය කවර අවස්ථාවක වුව ද, මණ්ඩලය රැස්විය යුතු ය.

(10) අවශ්‍ය යයි තමා සලකන කවර අවස්ථාවක නැතහොත් මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවකගෙන් ලිඛිත ඉල්ලීමක් ලැබී සතියක් ඇතුළත අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

12. (1) පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ආයතනය වෙත මෙම නියමාවලියෙන් පැවරෙන නැතහොත් නියම කෙරෙන බලතල, කාර්ය හා කර්තව්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(2) පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව ආයතනයේ ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ හා විභාග පිළිබඳ පාලනය හා සාමාන්‍ය විධානය මණ්ඩලය සතු වන්නේ ය.

(3) (1) වන සහ (2) වන අනුච්ඡේදවලින් මණ්ඩලය වෙත පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය:—

(අ) ආයතනයේ දේපළ සහ අරමුදල් සතුව සිටීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම ;

(ආ) ආයතනයට සම්බන්ධ සියලු කාරණා පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක් විධිවිධානවලට අනුකූලව විධිමත් කිරීම හා නිශ්චය කිරීම ;

(ඇ) නිශ්චිත කාර්යයන් සඳහා ආයතනයට සුදුස්සක් කර ගැනීමට සපයන ලද යම් අරමුදල් පරිපාලනය කිරීම ;

(ඈ) ආයතනයට අන්තිම කැමති පත්‍ර මගින්, පරිත්‍යාග මගින් හා වෙනත් ප්‍රදාන මගින් පවරනු ලබන දේපළ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව භාර ගැනීම හා පිළිගැනීම ;

(ඉ) ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගණන් සලකා බැලීම සහ ඒ වාර්තාව හා ගණන් විශ්ව විද්‍යාලය සහ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(ඊ) ආයතනයේ මුදල් ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ඒ ඇස්තමේන්තු විශ්ව විද්‍යාලය හා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(උ) වෛද්‍ය විද්‍යාවේ විවිධ විශේෂ ක්ෂේත්‍රයන්හි ප්‍රදානය කළ කළ යුතු පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ අනෙකුත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිළිබඳවත්, හැදෑරිය යුතු අධ්‍යයන පාඨමාලා, ලැබිය යුතු පුහුණුව, සාමර්ථ්‍යය ලැබිය යුතු විභාග පිළිබඳවත්, එවැනි උපාධි, අභිඥානපත්‍ර, සහතික පත්‍ර හා ශාස්ත්‍රීය විශිෂ්ටතාවලට සුදුස්සන් වීමේ අභිලාෂය ඇති ශිෂ්‍යයන් විසින් සපුරා ලිය යුතු වෙනත් කොන්දේසි පිළිබඳවත්, අදාළ අධ්‍යයන සභාව හෝ සභාවල එකඟත්වය ඇතිව විශ්ව විද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ඌ) අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය දෙනු ලැබ ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද, ඒ කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කර විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් පැනවීම සඳහා ඉදිරිපත් කිරීම ;

එසේ වුවද, අදාල අධ්‍යයන සභාවේ හෝ සභාවල වාර්තා සලකා බැලීමෙන් අනතුරුව මිස, අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් නොකළ යුතු ය.

(එ) අදාල අධ්‍යයන සභාවේ හෝ සභාවල වාර්තා සලකා බැලීමෙන් පසු අධ්‍යයන පාඨමාලාවලට හා විභාගවලට අදාළ නියෝග කෙටුම්පත් කර, ඒ කෙටුම්පත් විශ්ව විද්‍යාලයේ සනාතන සභාව විසින් පැනවීම සඳහා ඉදිරිපත් කිරීම ;

(ඒ) රීති සෑදීමට බලය දෙනු ලැබ ඇත්තේ හෝ රීති සෑදිය හැක්කේ යම් කාරණා සම්බන්ධයෙන් ද, ඒ කාරණා සඳහා රීති කෙටුම්පත් කිරීම සහ ඒ කෙටුම්පත් අවස්ථාවෝචිත පරිදි, විශ්ව විද්‍යාලයේ පාලක සභාවට හෝ සනාතන සභාවට, පැනවීම සඳහා ඉදිරිපත් කිරීම ;

(ඔ) ආයතනයේ කටයුතු පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි, භූමිභාග ලී බඩු, උපකරණ හා වෙනත් ද්‍රව්‍ය සැපයීම ;

(ඕ) ආයතනයේ ආචාර්යවරයන් හා පරීක්ෂකවරයන් ලෙස පිළිගැනීම සුදුසු යයි සලකනු ලබන තැනැත්තන් අදාල අධ්‍යයන සභාව හෝ සභා විමසීමෙන් පසු විශ්වවිද්‍යාලයේ පාලක සභාවට නිර්දේශ කිරීම :

(ක) අදාල අධ්‍යයන සභාවේ හෝ සභාවල වාර්තා සලකා බැලීමෙන් පසු—

(i) පවත්නා අධ්‍යයන සභා ප්‍රතිසංවිධානය කිරීම සඳහා සහ අලුත් අධ්‍යයන සභා සංවිධානය කිරීම සඳහා වූ යෝජනා ක්‍රම ; සහ

(ii) වෛද්‍ය විද්‍යාවේ විශේෂ ක්ෂේත්‍රයන් අදාල අධ්‍යයන සභාවලට පැවරීම

පිළිබඳව විශ්ව විද්‍යාලයේ අනුමතය සහිතව කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ග) මණ්ඩලයට සුදුසු යයි පෙනී යන ප්‍රමාණයක ස්ථාවර කමිටු හෝ තත් කාර්ය කමිටු පත් කිරීම හා ඒවායේ විෂයය කරුණු නියම කිරීම සහ ඒ කමිටුවල වාර්තා සලකා බැලීම හා වෙනස් කිරීම් ඇතිව හෝ නැතිව ඒ වාර්තා අනුමත කිරීම හෝ ඒ වාර්තා ප්‍රතික්ෂේප කිරීම ;

(ච) අධ්‍යයන පාඨමාලාවලට ශිෂ්‍යයන් ඇතුල් කර ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අදාල අධ්‍යයන සභාව හෝ සභා විමසීමෙන් පසු විශ්ව විද්‍යාලයේ එකඟත්වය ඇතිව නිශ්චය කිරීම ;

(ජ) ප්‍රයෝජනයට නොයොදා ඇති යම් ආදායමක් ද ඇතුළුව ආයතනයට අයත් කවර මුදලක් වුව ද, භාර ආඥාපනතේ 20 වන වගන්තියේ හෝ වෙනත් ලිඛිත නීතියක හෝ විධිවිධාන යටතේ භාරකාර මුදල් නියමානුකූලව ආයෝජනය කළ හැකි යම් සුරැකුම් පතක ආයෝජනය කිරීම ; නැතහොත් කොමිෂන් සභාවේ අනුමතය ඇතිව ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිළට ගැනීම සඳහා එවැනි යම් මුදලක් ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ ඒ මුදල් වලින් වියදම් සඳහා වහාම අවශ්‍ය නොවන යම් කොටසක් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථිර තැන්පත් මුදලක් ලෙස තැන්පත් කිරීම ; සහ

(ට) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මේ නියමාවලියෙහි හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක හෝ අන්‍යාකාර විධිවිධාන සලස්වා නොමැති වූ, ආයතනයේ අනිකුත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම ;

එසේ වුව ද, උචිත අධ්‍යයන සභාවේ මතය මණ්ඩලය වෙත වාර්තා කිරීමේ හා යැවීමේ අවස්ථාවක් ඒ අධ්‍යයන සභාවට ප්‍රථමයෙන් දී ඇත්තේ නම් මිස, යම් අධ්‍යයන කාරණයක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කිසිම යෝජනාවක් සම්මත කර නොගත යුතු ය.

එසේම තවදුරටත්, විශ්ව විද්‍යාලයේ එකඟත්වය ඇතිව මිස, එසේ සම්මත කර ගන්නා ලද යෝජනාවක් ක්‍රියාත්මක නොකළ යුතු ය.

මේ ඡේදයෙහි "අධ්‍යයන කාරණය" යන්නෙන් උචිත අධ්‍යයන සභාවේ පාලනයට හා සාමාන්‍ය විධානයට යටත් කාරණයක් අදහස් වේ.

13. වෛද්‍ය විද්‍යාවේ පහත සඳහන් එක් එක් විශේෂ ක්ෂේත්‍රයක් වෙනුවෙන් සහ කළමනාකාර මණ්ඩලයේ සහ විශ්ව විද්‍යාලයේ නිර්දේශ මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන වෛද්‍ය විද්‍යාවේ වෙනත් එක් එක් විශේෂ ක්ෂේත්‍රයන් වෙනුවෙන් ආයතනය විසින් අධ්‍යයන සභා ප්‍රතිෂ්ඨාපිත කළ යුතු ය.

(අ) නිර්වින්දනවේදය ;

(ආ) ප්‍රජා වෛද්‍ය විද්‍යාව ;

(ඇ) දන්ත ශල්‍ය විද්‍යාව ;

(ඈ) පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තිය ;

(ඉ) වෛද්‍ය විද්‍යාව ;

(ඊ) ධාත්‍රීභෘත්‍යය හා නාරිවේදය ;

(උ) අක්ෂිවේදය ;

(ඌ) ව්‍යාධිවේදය ;

(එ) කෞමාරභෘත්‍යය ;

(ඒ) මනෝ වෛද්‍ය විද්‍යාව ;

(ක) විකිරණවේදය ; සහ

(ග) ශල්‍ය වෛද්‍ය විද්‍යාව.

14. (1) ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල හෝ විශ්ව විද්‍යාලයීය විද්‍යායතන එකක් හෝ ඊට වැඩි ගණනක අධ්‍යයන අංශ පිහිටුවා ඇති විශේෂ ක්ෂේත්‍රයක් වෙනුවෙන් යම් අධ්‍යයන සභාවක් පිහිටුවා ඇති කල්හි, ඒ අධ්‍යයන සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය :—

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) ශ්‍රී ලංකාවේ යම් විශ්ව විද්‍යාලයක හෝ විශ්ව විද්‍යාලයීය විද්‍යායතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෝ එම අමාත්‍යාංශයට අයත් යම් දෙපාර්තමේන්තුවක හෝ සේවයේ යෙදී සිටින්නා වූ හෝ සිටියා වූ හෝ උචිත වෘත්තීය මණ්ඩලය විසින් ඒ වෘත්තීය මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගන්නා ලද සාමාජිකයන් පස් දෙනෙකු ;

(ඇ) ශ්‍රී ලංකාවේ එක් එක් විශ්වවිද්‍යාලයේ හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ උචිත අධ්‍යයනාංශයේ ප්‍රධානියා;

(ඈ) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය විසින්, එම පීඨයට අයත් මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් තෝරා පත් කර ගන්නා ලද එක් සාමාජිකයෙක්; සහ

(ඉ) ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය විසින්, එම පීඨයට අයත් මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් තෝරා පත් කර ගන්නා ලද එක් සාමාජිකයෙක්.

(2) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයක් හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් අධ්‍යයන අංශයක් පිහිටුවා නොමැති විශේෂ ක්ෂෙත්‍රයක් වෙනුවෙන් යම් අධ්‍යයන සභාවක් පිහිටුවා ඇති කල්හි, ඒ අධ්‍යයන සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය:—

(අ) අධ්‍යක්ෂවරයා;

(ආ) උචිත වෘත්තීය මණ්ඩලය විසින් එම වෘත්තීය මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගන්නා ලද සාමාජිකයන් පස් දෙනෙක්;

(ඇ) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය විසින්, එම පීඨයට අයත් මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් තෝරා පත් කර ගන්නා ලද එක් සාමාජිකයෙක්; සහ

(ඈ) ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය විසින්, එම පීඨයට අයත් මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් තෝරා පත් කර ගන්නා ලද එක් සාමාජිකයෙක්.

(3) (අ) උචිත වූ වෘත්තීය මණ්ඩලයක් නොමැතිවීමේ හේතුවෙන්, (1) වන අනුච්ඡේදය යටතේ සංස්ථාපනය කරන ලද යම් අධ්‍යයන සභාවක මුළු සාමාජික සංඛ්‍යාව දොළහකට අඩු වන කල්හි, කළමනාකාර මණ්ඩලය විසින්, එකී අධ්‍යයන සභාවේ මුළු සාමාජික සංඛ්‍යාව දොළහක් වන පරිදි, වෛද්‍ය වෘත්තියට අයත් සාමාජිකයන් අතුරින් යම් ගණනාවක් එම අධ්‍යයන සභාවට පත් කළ යුතු ය.

(ආ) උචිත වූ අධ්‍යයන අංශයක් නොමැතිවීමේ හේතුවෙන්, (1) වන අනුච්ඡේදය යටතේ සංස්ථාපනය කරන ලද යම් අධ්‍යයන සභාවක මුළු සාමාජික සංඛ්‍යාව දොළහකට අඩු වන කල්හි, කළමනාකාර මණ්ඩලය විසින්, එකී අධ්‍යයන සභාවේ මුළු සාමාජික සංඛ්‍යාව දොළහක් වන පරිදි, වෛද්‍ය වෘත්තියට අයත් සාමාජිකයන් අතුරින් යම් ගණනාවක් එම අධ්‍යයන සභාවට පත් කළ යුතු ය.

(ඇ) (අ) වන සහ (ආ) වන ඡේදයන්හි එන විධිවිධාන, එම ඡේදයන්හි "සාමාජිකයන් දොළොස් දෙනෙකු" යන යෙදුම යෙදෙන අවස්ථාවල දී ඒ වෙනුවට "සාමාජිකයන් අට දෙනෙකු" යන යෙදුම ආදේශ කිරීමට යටත්ව, (2) වන අනුච්ඡේදය යටතේ සංස්ථාපනය කරන ලද අධ්‍යයන සභාවක් කෙරෙහි ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(4) නිශ්චිත කාර්යයක් සඳහා නිශ්චිත කාල පරිච්ඡේදයකට, එක් තැනැත්තෙකු හෝ එක් තැනැත්තෙකුට වැඩි සංඛ්‍යාවක් මණ්ඩලයේ එකඟත්වය ඇතිව අධ්‍යයන සභාවකට සහාය වීමට සම්බන්ධ කර ගත හැකි ය. එසේ සම්බන්ධ කරගත් කිසිම තැනැත්තෙකුට ඡන්දයෙන් පත්වීම සඳහා ඉදිරිපත් වීමට හෝ එම අධ්‍යයන සභාවේ රැස්වීමකදී ඡන්දය දීමට හෝ අයිතියක් නොමැති විය යුතු ය.

(5) යම් අධ්‍යයන සභාවකට තෝරා පත් කරන ලද එක් එක් සාමාජිකයකු සම්බන්ධයෙන් 11 වන ඡේදයේ (3) වන (4) වන සහ (6) වන අනුච්ඡේදවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

(6) එක් එක් අධ්‍යයන සභාවකට අධ්‍යයන සභාවේ සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන සභාපතිවරයකු සිටිය යුතු ය.

(7) එක් එක් අධ්‍යයන සභාව සඳහා කළමනාකාර මණ්ඩලය විසින් පත් කළ යුතු ලේකම්වරයකු සිටිය යුතු අතර, ඔහු එම අධ්‍යයන සභාවේ සාමාජිකයකු නොවිය යුතු ය.

(8) (අ). (1) වන අනුච්ඡේදය යටතේ සංස්ථාපනය කරන ලද අධ්‍යයන සභාවක රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය සාමාජිකයන් හතර දෙනෙකු විය යුතු අතර, යොදා ගත් සාමාජිකයන් සිටී නම් බැහැර කළ යුතු ය.

(ආ). (2) වන අනුච්ඡේදය යටතේ සංස්ථාපනය කරන ලද අධ්‍යයන සභාවක රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය සාමාජිකයන් තුන් දෙනෙකු විය යුතු අතර, යොදා ගත් සාමාජිකයන් සිටී නම් බැහැර කළ යුතු ය.

(9) එක් වර්ෂයකදී දහයකට නො අඩු රැස්වීම් සංඛ්‍යාවක් පැවැත්වෙන පරිදි, අවශ්‍ය කවර අවස්ථාවක වුව ද, එක් එක් අධ්‍යයන සභාව රැස්විය යුතු ය.

15. (1) පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, එක් එක් අධ්‍යයන සභාවකට වෛද්‍ය විද්‍යාවේ අදාළ විශේෂ ක්ෂෙත්‍රය සම්බන්ධ ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ හා විභාග පිළිබඳ පාලනය හා සාමාන්‍ය විධානය සතු වන්නේ ය.

(2) (1) වන අනුච්ඡේදයෙන් එක් එක් අධ්‍යයන සභාවක් වෙත පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, එක් එක් අධ්‍යයන සභාව විසින්, වෛද්‍ය විද්‍යාවේ අදාළ විශේෂ ක්ෂෙත්‍රය සම්බන්ධයෙන් පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(අ) කළමනාකාර මණ්ඩලය විසින් තමන් වෙත යොමු කරන ලද කවර කරුණක් හෝ පිළිබඳව සලකා බැලීමෙන් පසු වාර්තා කිරීම;

(ආ) වෛද්‍ය විද්‍යාවේ යම් විශේෂ ක්ෂෙත්‍රයකට අදාළ වූ අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩ සටහන හෝ සටහන් හා විභාගවලට සම්බන්ධිත සියලු කාරණා සම්බන්ධයෙන් නිර්දේශ සහ වාර්තා කළමනාකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම;

(ඇ) යම් විශේෂ විෂයයක් හෝ විෂයයන් සලකා බලා ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීමේ කාර්යය සඳහා අධ්‍යයන සභාවේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් විය හැකි කමිටු පත් කිරීම;

(ඈ) අධ්‍යයන පාඨමාලාවලට සහ විභාගවලට ශිෂ්‍යයන් ඇතුල් කර ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්බන්ධයෙන් කළමනාකාර මණ්ඩලය වෙත නිර්දේශ කිරීම;

(ඉ) වෛද්‍ය විද්‍යාවේ අදාළ විශේෂ ක්ෂේත්‍රයන් සම්බන්ධ අධ්‍යයන පාඨමාලා හා විභාග පිළිබඳ නියෝග කෙටුම්පත් කිරීම සහ එකී කෙටුම්පත් කළමනාකාර මණ්ඩලයට ඉදිරිපත් කිරීම;

(ඊ) ආචාර්යවරයන් සහ පරීක්ෂකවරයන් වශයෙන් පිළිගැනීම සඳහා සුදුසු යයි සලකනු ලබන තැනැත්තන් සම්බන්ධයෙන් කළමනාකාර මණ්ඩලයට නිර්දේශ කිරීම;

(උ) වෛද්‍ය විද්‍යාවේ අදාළ විශේෂ ක්ෂේත්‍රයට නියමිත විභාග සමත්වීමෙන් හා වෙනත් නියමිත කොන්දේසි සපුරාලීමෙන්, ඒ විශේෂ ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි, අභිඥන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා, සුදුසුකම් ලබා ඇති තැනැත්තන් සම්බන්ධයෙන් කළමනාකාර මණ්ඩලයට නිර්දේශ කිරීම;

(ඌ) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග සඳහා තරග කිරීමේ ක්‍රම හා කොන්දේසි සම්බන්ධයෙන් කළමනාකාර මණ්ඩලය වෙත නිර්දේශ කිරීම;

(එ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා සුදුසු තැනැත්තන්ගේ නම් සම්බන්ධයෙන් කළමනාකාර මණ්ඩලය වෙත නිර්දේශ කිරීම; සහ

(ඒ) (i) පවත්නා අධ්‍යයන සභා ප්‍රතිසංවිධානය කිරීම සඳහා සහ අලුත් අධ්‍යයන සභා සංවිධානය කිරීම සඳහා වූ යෝජනා ක්‍රම; සහ

(ii) වෛද්‍ය විද්‍යාවේ විශේෂ ක්ෂේත්‍රයන් අදාළ අධ්‍යයන සභාවලට පැවරීම සම්බන්ධයෙන් කළමනාකාර මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.

16. ආයතනයේ මුදල් වර්ෂය ආණ්ඩුවේ මුදල් වර්ෂයම වන්නේ ය.

17. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් ආයතනයට තිබිය යුතු අතර, පහත සඳහන් මුදල් එයට ගෙවිය යුතු ය:—

(අ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන අනුව ආයතනයට ගෙවිය යුතු ගාස්තු;

(ආ) පරිත්‍යාගවලින් ලැබෙන ආදායම.

(ඇ) පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරන ලද, කොමිෂන් සභාව විසින් ආයතනයට ආධාර මුදල් වශයෙන් ගෙවනු ලබන්නා වූ මුදල්; සහ

(ඈ) ආයතනයට අයිති වූ ද, කවර ප්‍රභවයකින් හෝ අත් කර ගනු ලැබුවා වූ ද වෙනත් සියලු මුදල්.

(2) යම්කිසි මාසයක් තුළදී අරමුදලට ගෙවනු ලබන මුදල් ප්‍රමාණයන් පිළිබඳ සාරාංශයක්, උචිත ආදායම් ශීර්ෂ යටතේ වර්ග කර, ඊළඟ ඉදිරි මාසය අවසාන වීමට පෙර අධ්‍යක්ෂ විසින් කොමිෂන් සභාවට දැනගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

18. (අ) නියමාවලි මගින් නියම කරනු ලැබිය හැකි පිළිවෙළට හා ආකාරයට ආයතනයේ ගණන් තැබීම;

(ආ) අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් භාර ගැනීම සහ ඒ මුදල් නිසි ගණන් ශීර්ෂයන්ට බැර කිරීම;

(ඇ) බලය දෙනු ලැබූ සියලු ගෙවීම් කිරීම; සහ

(ඈ) කොමිෂන් සභාවට අවශ්‍ය ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු සහ ඉදිරි මුදල් වර්ෂය සඳහා වාර්ෂික මුදල් විසර්ජන කළමනාකාර මණ්ඩලය සඳහා පිළියෙල කිරීම

අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය.

එසේ වුව ද, ආයතනයේ ගිණුම්වල නිශ්චිත කාර්ය සඳහා කරනු ලබන ප්‍රතිපාදනවලින් හෝ නිශ්චිත අරමුණු සඳහා වූ පරිත්‍යාගවලින් ලැබෙන ආදායම් සම්බන්ධයෙන් වෙනම ගිණුම් පෙන්නුම් කළ යුතු අතර, ආයතනයේ සාමාන්‍ය කාර්ය සඳහා හෝ ඒ ප්‍රතිපාදන හෝ පරිත්‍යාග කරනු ලැබුවේ පිළිවෙලින් යම් කාර්ය හෝ අරමුණු සඳහා ද, ඒ කාර්ය හෝ අරමුණු නොවන කරුණු සඳහා ඒ ආදායමින් කිසිම ගෙවීමක් නොකළ යුතු ය.

19. (1) කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන පිළිවෙළට හා ආකාරයට සහ එසේ නියම කරනු ලබන විස්තර ඇතුළත් කොට සිය ආයතනයේ කටයුතුවලට අදාල වාර්ෂික ගණන් හා සංඛ්‍යා ලේඛන පිළිබඳ ප්‍රකාශයක් ආයතනය විසින් පිළියෙල කළ යුතු ය.

(2) ආයතනයේ ගණන් පොත් ආයතනයේ කාර්යාලයෙහි තැබිය යුතු ය.

20. උසස් අධ්‍යාපන ආයතනයක ගණන් විගණනය සම්බන්ධයෙන් පනතේ XIII වන කොටසේ යම් විධිවිධානයක් අදාළ ද, ඒ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ආයතනයේ ගණන් විගණනයට හා ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

21. (1) ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි ආයතනය විසින් විශ්වවිද්‍යාලයේ එකඟත්වය සහ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව සලකනු ලබන නිලධරයන්ගෙන් සහ වෙනත් සේවකයන්ගෙන් ආයතනයේ කාර්ය මණ්ඩලය සමන්විත විය යුතු ය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලය විශ්ව විද්‍යාලය විසින් ස්වකීය කාර්ය මණ්ඩලයෙන් මුදා හැරීමෙන් ලබා දිය යුතු ය. නැතහොත් විශ්ව විද්‍යාලය විසින් කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව පත් කළ යුතු ය. පනතේ X වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ආයතනයේ කාර්ය මණ්ඩලයට කෙරෙන පත් කිරීම් කෙරෙහි හා පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(3) විශ්ව විද්‍යාලයේ නිලධරයෙකුගේ හෝ වෙනත් සේවකයකුගේ සේවය ආයතනයට පූර්ණකාල පදනමක් මත ලබා දී ඇති අවස්ථාවක විශ්ව විද්‍යාලයේ ඔහුගේ නිත්‍ය තනතුරෙහි හිමි වේතනය හා දීමනා ආයතනය විසින් ඔහුට ගෙවිය යුතු ය. අනෙකුත් අවස්ථාවක විශ්ව විද්‍යාලය විමසීමෙන් පසු කොමිෂන් සභාවේ අනුමතය ඇතිව ආයතනය විසින් නිශ්චය කරනු ලබන දීමනාවක් අදාල නිලධරයාට හෝ වෙනත් සේවකයාට ගෙවිය හැකි ය.

(4) අධ්‍යක්ෂගේ විධානවලට හා විනය පාලනයට ආයතනයේ කාර්ය මණ්ඩලය යටත් විය යුතු ය.

22. ආයතනයේ යම් බල මණ්ඩලයකට හෝ වෙනත් මණ්ඩලයකට යම් තැනැත්තකු යථා පරිදි තෝරා පත් කර ගනු ලැබී ද, පත් කරනු ලැබී ද, නම් කරනු ලැබී ද, අතිරේකව යොදනු ලැබී ද නැතහොත් ඔහු ඒ බල මණ්ඩලයේ හෝ වෙනත් මණ්ඩලයේ සාමාජිකයකුව සිටීමට හිමිකම් ලබා තිබේ ද යන්න ගැන යම් ප්‍රශ්නයක් පැන නැගුනහොත් ඒ ප්‍රශ්නය කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් වූ කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

23. ආයතනයේ යම් බල මණ්ඩලයක හෝ වෙනත් මණ්ඩලයක කිසිම ක්‍රියාවක්, යෝජනා සම්මතයක් හෝ ක්‍රියා මාර්ගයක් එහි සාමාජිකයන් අතර පුරප්පාඩුවක් හෝ පුරප්පාඩු තිබීමේ හෝ එහි සාමාජිකයන් පත් කිරීමේ යම් දෝෂයක් හෝ දෝෂ ඇතිවීමේ හේතුවෙන් පමණක් අවලංගු නොවන්නේ ය.

24. මෙම නියමාවලිය ක්‍රියාත්මකවීමත් සමඟ වෛද්‍ය විද්‍යාවෙහි විවිධ ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීමේ සහ පිරිනැමීමේ බලය ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලය මත පමණක් පැවරෙන්නේ ය. එසේ වුව ද —

(1) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලය විසින් එහි උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කළ යුත්තේ සහ පිරිනැමිය යුත්තේ ආයතනයේ නිර්දේශය මත පමණි.

(2) පනත යටතේ ස්ථාපනය කරන ලද්දා වූ ලෙස සැලකෙන යම් විශ්ව විද්‍යාලයකට, මෙම නියමාවලිය ක්‍රියාත්මක වීමේ දිනට පෙරාතුව එම විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි වෛද්‍ය ශිෂ්‍යයන් ලෙස ලියාපදිංචි වී සිටියා වූ ද, එකී උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීමට හෝ පිරිනැමීමට අවශ්‍ය කොන්දේසි සපුරා ඇත්තා වූ පුද්ගලයන්ට එකී උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කළ හැකිය නැතහොත් පිරිනැමිය හැකිය. තවද,

(3) වෛද්‍ය විද්‍යාවේ විශේෂ ක්ෂේත්‍රයන්හි ශාස්ත්‍රීය විශිෂ්ටතා, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලය සහ ආයතනය සමඟ පිළියෙල කර ගැනීමෙන් පසු කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව වෘත්තීය මණ්ඩල විසින් ප්‍රදානය කළ හැකි ය.

25. මෙම නියමාවලියෙහි —

"පනත" යන්නෙන් 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත අදහස් වේ;

"උචිත සාධන පත්‍රය" යන්නෙන් ඉහත සඳහන් පනතේ විධිවිධාන අනුව කරනු ලැබූ යම් නියමයක්, සාදනු ලැබූ නියමාවලියක් ලිඛිත ව්‍යවස්ථාවක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් අදහස් වේ;

"කොමිෂන් සභාව" යන්නෙන් පනතේ විධිවිධාන අනුව ස්ථාපනය කරන ලද් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ;

"වෘත්තීය මණ්ඩලය" යන්නෙන් පාර්ලිමේන්තු පනතක් මගින් සංස්ථාගත කරන ලද හෝ ආයතනයේ කළමනාකාර මණ්ඩලය විසින් පිළිගන්නා ලද යම් සංගමයක්, විද්‍යායතනයක් හෝ වෛද්‍ය විද්‍යාවේ කවර හෝ විශේෂ ක්ෂේත්‍රයකට අයත් පුද්ගල මණ්ඩලයක් අදහස් වේ; සහ

"වෛද්‍ය විද්‍යාවේ විශේෂ ක්ෂේත්‍රය" යන්නෙන් නිර්වින්දවේදය, ප්‍රජා වෛද්‍ය විද්‍යාව, පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තිය, වෛද්‍ය විද්‍යාව, ධාත්‍රීභෘත්‍යය හා නාරිවේදය, අක්ෂිවේදය, කෞමාරභෘත්‍යය, මනෝ වෛද්‍ය විද්‍යාව, විකිරණ වේදය, ශල්‍ය වෛද්‍ය විද්‍යාව හෝ ආයතනයේ සහ විශ්ව විද්‍යාලයේ නිර්දේශ මත කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද්දා වූ වෙනත් විශේෂ ක්ෂේත්‍රයක් අදහස් වේ.

4-275

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.